ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්ලිව්එම්/සී/කේජීඑල්එල්/1/22
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2023 අගෝස්තු 31 දින

සභාපති,

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම.

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය

2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය
எனது இல.
My No. } අයිඩබ්ලිව්එම්/සී/කේජීඑල්එල්/1/22

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 අගෝස්තු 31 දින

සභාපති,

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම

**කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ ("සමාගම") 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 2.36 ඡේදයට පටහැනිව සමාගමේ 2018 වර්ෂයේ සිට 2021 මාර්තු 31 දින දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ ස්ථාවර තැන්පතු පොලී රු.1,939,610 ක් මුදල් පදනම මත සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු.3,883,025 ක් වූ පූර්ව කාලපරිච්ඡේද ගැළපුම් වලට අදාළව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 10.23 ඡේදයේ (a) සිට (d) දක්වා වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 79(ඇ) ඡේදය ප්‍රකාරව දැනට භාවිතා නොකරන රු.23,210,000 ක් වූ යන්ත්‍රෝපකරණ පිළිබඳව මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් ගනුදෙනුකරුවන් වෙනුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට ගෙවන ලද රු.827,410 ක රාජ්‍යභාගය ලැබිය යුතු දෑ ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තොගයේ වෙනස්වීම රු.127,734 කින් අඩුවෙන් ද පොලී ගෙවීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමාගමේ 2021/2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමාගමේ 2021/2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන

වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ,2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතෙහි 6.6. ඡේදය | ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාගමේ 2021/2022 ගිණුම් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2023 අප්‍රේල් 03 දිනදීය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය | සමාගම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 **වෙනත් නිරීක්ෂණ**

(අ) විකුණුම් වලට අදාළ රාජ්‍යභාග ගැනුම්කරුගෙන් අයකර ගැනීම සමාගම විසින් දිගින් දිගටම සිදුකර තිබුණද ඒ පිළිබඳව වූ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත් මිනිරන් කැණීම් කර මාසික නිෂ්පාදිතය මෙට්‍රික් ටොන් 90 දක්වා වර්ධනය කර ගැනීමට සමාගම සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මාසික සාමාන්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 29 ක් වූ අතර මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 342.35 ක් විය. ඒ අනුව මෙට්‍රික් ටොන් 599.30 ක් වූ ඉකුත් වර්ෂයේ නිෂ්පාදනයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 256.95 කින් අඩුවී තිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව අමුද්‍රව්‍ය ස්වරූපයේ මිනිරන් මෙට්‍රික් ටොන් 680 ක් පෙරසැරිකර අපනයනය කිරීම මගින් රු.මිලියන 219.7 ක ආදායමක් ඉපැයීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මිනිරන් මෙට්‍රික් ටොන් 384.81 ක් දේශීය හා විදේශීය වශයෙන් අලෙවි කර රු.මිලියන 123.4 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි.

(ඈ) ලෝකයේ ස්වාභාවික ස්ඵටික ධමනි මිනිරන් සඳහා වූ අද්විතීය සැපයුම්කරුවීම සමාගමේ දැක්ම වුවද සමාගම තම ගැනුම්කරුවන් තෝරා ගැනීමට ජාත්‍යන්තර ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණු අතර දිගින් දිගටම විදේශීය ගැනුම්කරුවන් දෙදෙනෙකුට සමාගමේ මුළු නිෂ්පාදනය අපනයන කරමින් පැවතුණි. ඒ හේතුවෙන් සමාගමේ දැක්ම අනුව කාර්ය මෙහෙයවීමක් නොවූ අතර විදේශීය ගැනුම්කරුවන් අතර තරඟකාරීත්වයක් ඇතිකර මිනිරන් සඳහා ඉහළ මිලක් ලබාගැනීමට හා නව වෙළඳපොළ සොයා ගැනීමටද නොහැකිව තිබුණි. මෙහිදී, සමාලෝචිත වර්ෂයේ අලෙවි ප්‍රවර්ධනය සඳහා සැලසුම් කළ වෙළඳපොළ ප්‍රචාරණය , තානාපති කාර්යාල වල සහය ලබා ගැනීම, ජාත්‍යන්තර ප්‍රභව වලින් ලෝක මිල ගණන් ලබා ගැනීම යනාදී කාර්යභාරයයන් ක්‍රියාත්මක කරද නොතිබුණි.

(ඉ) මිනිරන් ඛනිජය සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලීන් සිදුකිරීම අරමුණු කර ගෙන සමාගමේ විද්‍යාගාරය ස්ථාපිත කර තිබුණද ඊට අදාළ කාර්යයන් කිසිවක් එහි සිදුකර නොතිබුණු අතර අපනයනය සඳහා සකස් කරන ලද මිනිරන් සාම්පල තුළ අන්තර්ගත කාබන් ප්‍රතිශතය මිනුම් කිරීම පමණක් එහිදී සිදුකර තිබුණි. සමාගම වර්තමානය වන විට පියලි (Flake- 97%-99%) සහ චිප්ස් (Chips-90%-92%C) යන ආකාර වලින් පමණක් මිනිරන් අපනයනය කර තිබුණු අතර අගය එකතු කර නිමි හෝ අර්ධනිමි වශයෙන් නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි.

(ඊ) තොගයෙන් වැඩි ප්‍රමාණයක් එනම්, සියයට 57 ක් පමණ අඩු කාබන් ප්‍රතිශතයකින් යුත් මිනිරන් වලින් සමන්විත වී තිබුණු අතර Flotation යන්ත්‍රයක් මිලදීගෙන, එය ආධාරයෙන් අඩු කාබන් සහිත මිනිරන්වල කාබන් ප්‍රතිශතය ඉහළ නංවා ආදායම වැඩිකර ගැනීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂා කර තිබුණද මුදල් නොලැබීම හේතුවෙන් 2023 ජුනි 30 වන විටද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(උ) කහටගහ පතලට අයත් අක්කර 26.5 ක් සහ අක්කර 6 ක ඉඩම් කොටස් දෙකක් සම්බන්ධයෙන් අයිතිවාසිකම් ඉදිරිපත් කරමින් බාහිර පුද්ගලයින් විසින් පිළිවෙලින් 2004 සහ 2007 වර්ෂ වලදී සමාගමට එරෙහිව නඩු පවරා තිබුණි. එසේ වුවද එම නඩු කටයුතු විගණිත දිනය වූ 2023 මැයි 31 දින වන විටත් නිරවුල් වී නොතිබුණි. තවද, පතලේ සේවය කළ පුද්ගලයින් තිදෙනෙකුද ඇතුළුව 11 දෙනෙකු පතල් භූමිය තුළ පිහිටි රූඩ් 8 යි පර්චස් 87 ක ප්‍රදේශයක් තුළ පිහිටි නිල නිවාසවල අනවසරයෙන් පදිංචි වී සිටින අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කර ඇතත් 2023 මැයි 31 වන විටද නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) 2003 ඔක්තෝබර් 15 දිනැති ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියට අනුව දොඩම්ගස්ලන්ද යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් අවශ්‍යය ඉඩ පහසුකම් කහටගහ පතලට අයත් ඉඩම්වලින් ලබා දීමට 2003 ඔක්තෝබර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව 2003 වර්ෂයේ සිට වර්ෂ 03 ක කාලයක් සඳහා ඉඩම නිදහස් කර තිබුණද විගණිත දිනය වන විට එම කාලය වසර 18 ක් ඉක්මගොස් ඇතත් බදුකුලී ගිවිසුමකට එළඹීමෙන් හෝ බදුකුලී ගෙවීමෙන් තොරව පුහුණු මධ්‍යස්ථානය සඳහා ඉඩම පාවිච්චි කරනු ලබයි.

(එ) සමාගමේ පොල් වගාවේ ආදායම වූ රු.1,609,395 වෙනම ආදායම් මූලාශ්‍රයක් ලෙස හඳුනාගැනීම වෙනුවට විවිධ ආදායම් ලෙස දක්වා තිබුණි. ඊට අදාළ වියදම රු.2,587,823 ක් වීමෙන් ඒ තුළින් වූ ශුද්ධ අලාභය රු.978,428 ක් විය.

(ඒ) අනුමත කාර්ය මණ්ඩලය අනුව, සමාගම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත යුතු 79 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයකින් සමන්විත විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථිර කාර්ය මණ්ඩලය 42 ක්ද කොන්ත්‍රාත් පදනම මත 74 ක්ද, වැඩබැලීමේ පදනම මත එක් නිලධාරියෙක් හා අනියම් කම්කරුවන් 09 ක්ද, ඇතුළුව කාර්ය මණ්ඩලය 126 දෙනෙකු විය.

(ඹ) 2006 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණු සමාගමේ ජීප් රථය අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර සමාගම් භූමියේ නිෂ්කාර්යව ගාල් කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

# KAHATAGAHA GRAPHITE LANKA LIMITED

# Accounts

*For*

**2021/2022**

# KAHATAGAHA GRAPHITE LANKALIMITED
# Annual ACCOUNTS 2021/22

| CONTENT | PAGE |
|---|---|
| Corporate Information | **1** |
| Statement of Comprehensive Income | **3** |
| Statement of Financial Position | **4** |
| Statement of Changes in Equity | **5** |
| Statement of Cash Flow | **6** |
| Significant Accounting Policies | **7 - 13** |
| Financial Statement Disclosures | **14** |
| Notes to the Accounts | **15 - 22** |
| Tax Computations | **23 - 25** |

**KAHATAGAHA GRAPHITE LANKA LIMITED**

**STATEMENT OF COMPREHENSIVE INCOME**

| YEAR ENDED 31st MARCH | NOTES | 2021/2022 LKR | 2020/2021 LKR |
|---|---|---|---|
| **REVENUE** | | | |
| Sale of Graphite | 10 | 123,428,333 | 126,142,779 |
| Direct Cost, Mining Cost | 11 | (76,115,453) | (78,349,179) |
| **GROSS PROFIT/(LOSS)** | | **47,312,880** | **47,793,600** |
| Sundry Income | 12 | (888,428) | (1,462,534) |
| Interest Income | | 2,785,428 | 50,652 |
| **LESS: OPERATING COST** | | | |
| Personnel Cost | 13 | (16,073,342) | (17,470,898) |
| Establishment & Administration Cost | 14 | (8,336,222) | (6,690,505) |
| Maintenance Cost | 15 | (2,085,165) | (1,882,120) |
| Utility Cost | 16 | (922,947) | (1,109,656) |
| Depreciation Cost | 17 | (5,305,262) | (5,352,815) |
| Foreign Exchange Gain/(Loss) | | (4,625) | (294,373) |
| Defined Contribution Plan - Gratuity | 21 | (2,593,101) | 1,162,416 |
| Administration Cost | | (35,320,664) | (31,637,950) |
| Selling and Distribution Cost | 18 | (1,827,944) | (1,317,252) |
| Finance Cost | 19 | (975,512) | (1,949,315) |
| **OPERATING PROFIT/(LOSS)** | | 11,085,760 | 11,477,201 |
| Impairment | | - | - |
| **PROFIT/(LOSS) BEFORE TAXATION** | | **11,085,760** | **11,477,201** |
| Taxation | 30 | (2,697,714) | (2,300,670) |
| Deferred Tax Expenses | 26 | 74,200 | (376,143) |
| **PROFIT/(LOSS) AFTER TAXATION** | | **8,462,246** | **8,800,388** |
| **OTHER COMPREHENSIVE INCOME** | | | |
| Other comprehensive income / (loss) for the year | | | |
| **TOTAL COMPREHENSIVE INCOME/(LOSS) FOR THE YEAR** | | **8,462,246** | **8,800,388** |

**KAHATAGAHA GRAPHITE LANKA LIMITED**

**STATEMENT OF FINANCIAL POSITION**

| **AS AT 31 MARCH** | **NOTES** | **2021/2022 LKR** | **2020/2021 LKR** |
|---|---|---|---|
| **ASSETS** | | | |
| **Non Current Assets** | | | |
| Property, Plant & Equipment | 20 | 220,080,244 | 145,494,352 |
| Non Operating Assets | 21 | 23,210,000 | 3,773,062 |
| Coconut Plantation Development | | 1,694,235 | 1,694,235 |
| Gratuity Investment Fund | | 12,969,507 | 10,664,290 |
| Deferred Tax Assets | 26 | 78,745 | 4,545 |
| | | **258,032,731** | **161,630,485** |
| **Current Assets** | | | |
| Stock | 22 | 218,018,336 | 202,748,216 |
| Debtors, Deposit & Receivable | 23 | 34,380,827 | 13,987,222 |
| Cash & Cash Equivalent | 24 | 430,260 | 15,754,319 |
| | | **252,829,423** | **232,489,757** |
| **TOTAL ASSETS** | | **510,862,155** | **394,120,242** |
| **EQUITY AND LIABILITIES** | | | |
| **Capital And Reserves** | | | |
| Stated Capital | 25 | 13,000,000 | 13,000,000 |
| Revaluation Reserves | | 108,779,170 | - |
| Retained Earnings | | 330,624,051 | 322,161,803 |
| | | **452,403,221** | **335,161,803** |
| **Long Term Liabilities** | | | |
| Gratuity Provision | 27 | 18,091,672 | 16,881,328 |
| | | **18,091,672** | **16,881,328** |
| **Current Liabilities** | | | |
| NSB Loan Account - Short Term | 28 | 129,027 | 3,542,594 |
| Trade and Other Creditors | 29 | 6,558,964 | 5,217,558 |
| Provision For Taxation | 30 | 12,063,082 | 9,365,368 |
| Accrued Charges | 31 | 21,616,189 | 23,951,592 |
| | | **40,367,261** | **42,077,111** |
| **TOTAL EQUITY AND LIABILITIES** | | **510,862,155** | **394,120,242** |

I certify that the Financial Statements have been prepared in compliance with requirements of the Companies Act No7 of 2007.

| | |
|---|---|
| A .U.M.B.Bokalamulla | A.C.W.W.M.R.Koswatte |
| Machanical Engineer/ Acting Manager | Accountant |

The Board of Directors is responsible for the preparation of these Financial Statements signed for and on behalf of Board by

| | |
|---|---|
| T.C. Malawwe Thantri (LLB, Attorney-at-Law) | Ruchira L Weerasekara |
| Chairman | Director |

## STATEMENT OF CHANGES IN EQUITY

| | Share Capital<br>LKR | Revaluation Reserve<br>LKR | Accumulated Profit/(Loss)<br>LKR | Total<br>LKR |
|---|---|---|---|---|
| Balance on 01st April 2020 | 13,000,000 | - | 317,599,855 | 330,599,855 |
| Prior year adjustment | | | (4,238,439) | (4,238,439) |
| Profit/(Loss) for the Year | - | - | 12,683,414 | 12,683,414 |
| Balance on 31st March 2021 | 13,000,000 | - | 326,044,830 | 339,044,830 |
| Balance on 01st April 2021 | 13,000,000 | - | 326,044,830 | 339,044,830 |
| Prior year adjustment - (Note 1) | | | (3,883,025) | (3,883,025) |
| **Profit/(Loss) for the Year** | - | | 8,462,246 | 8,462,246 |
| Revaluation Adjustments | | 108,779,170 | | |
| Balance on 31st March 2022 | 13,000,000 | 108,779,170 | 330,624,051 | 343,624,051 |

Note 1

| | |
|---|---|
| Income Tax Adjustment | 632,121.00 |
| Surcharges on delay payments -Electricity - Adjustment | (1,356,892.30) |
| Cost of production adjustment | (2,511,081.79) |
| Royalty Adjustment | 913,359.84 |
| Security Bill Adjustment | (1,560,532.00) |
| | (3,883,025.25) |

**KAHATAGAHA GRAPHITE LANKA LIMITED**

**STATEMENT OF CASH FLOW**

| YEAR ENDED 31ST MARCH | 2021/2022<br>LKR | 2020/2021<br>LKR |
|---|---|---|
| **Cash Flows From/(Used in) Operating Activities** | | |
| Net Profit/(Loss) before Income Tax Expenses | 11,085,760 | 11,477,201 |
| Adjustments for : | | |
| Gratuity Provision | 2,593,101 | (1,162,416) |
| Depreciation on Tangible Fixed Assets | 16,836,061 | 21,583,480 |
| Forigne Exchange Gain / (Loss) | (4,625) | (294,373) |
| Interest Recived | (2,785,428) | (50,652) |
| Interest Expences | 958,635 | 1,900,644 |
| **Operating Profit before Working Capital changes** | 28,683,503 | 33,453,884 |
| (Increase)/Decrease in Inventories | (15,142,386) | (20,829,624) |
| (Increase)/Decrease in Receivable | (20,393,605) | 201,140 |
| (Decrease)/Increase in Loan Outstandings | (3,413,567) | 897,180 |
| (Decrease)/Increase in Creditors | 1,341,407 | 352,984 |
| (Decrease)/Increase in Accruals | (2,335,402) | 5,323,087 |
| **Cash Generated from Operations** | (11,260,050) | 19,398,651 |
| Interest Paid | (958,635) | (1,900,644) |
| Income Tax Paid | | |
| ***Net Cash Flow From/(Used in) Operating Activities*** | **(12,218,685)** | **17,498,007** |
| **Cash Flow From/(Used in) Investing Activities** | | |
| Purchase of Tangible Fixed Assets | (2,207,455) | (1,742,692) |
| Interest Recived | 2,785,428 | 50,652 |
| Gratuity Investment Fund | (2,305,217) | 1,623,714 |
| ***Net Cash Flows From/(Used in) Investing Activities*** | **(1,727,243)** | **(68,326)** |
| **Cash Flow From/(Used in) Financing Activities** | | |
| NSB Loan Account - Purchase Air Compresor | - | (3,010,566) |
| Gratuity Paid | (1,382,756) | (3,727,663) |
| **Net Cash Flows From/(Used in) Financing Activities** | **(1,382,756)** | **(6,738,229)** |
| Effect of Forigne currency exchange of Cash & Cash Equivalent | 4,625 | 294,373 |
| **Net Increase/(Decrease) Cash & Cash Equivalents** | (15,324,060) | 10,985,826 |
| Cash and Cash Equivalents at beginning of the year | 15,754,320 | 4,768,494 |
| **Cash and Cash Equivalents at end of the year** | **430,260** | **15,754,320** |

| **Cash & Cash Equivalents** | | |
|---|---|---|
| Bank Of Ceylon - Redigama | 36,243 | 625,620 |
| Bank Of Ceylon - Kollupitiya | 333,396 | 960,937 |
| DFC $ A/C - BOC Kollupitiya | 60,621 | 14,146,930 |
| Cash/ Cash Advance Acc. | - | |
| Petty Cash - Head Office | | 4,869 |
| Petty Cash - Mine Office | - | 15,964 |
| | **430,260** | **15,754,320** |

| YEAR ENDED 31 MARCH | NOTES | 2021/2022 LKR | 2020/2021 LKR |
|---|---|---|---|
| **10 SALE OF GRAPHITE** | | | |
| Graphite Sales Income | | 123,428,333 | 126,142,779 |
| Sales Income | | 123,428,333 | 126,142,779 |
| **11 DIRECT COST, MINING COST** | | | |
| Stock Balance at beginning | | 189,793,620 | 167,156,570 |
| Wages Cost | **11-01** | 55,445,534 | 57,958,999 |
| Support Service Cost | **11-02** | 24,433,347 | 26,796,564 |
| Depreciation | **11-03** | 11,530,799 | 16,230,666 |
| | | 281,203,300 | 268,142,799 |
| Less Stock at closing | **11-04** | (205,087,846) | (189,793,620) |
| **Add Cost of Mining During the Period** | | 76,115,453 | 78,349,179 |
| **Wages Cost** | **11-01** | | |
| Salaries & Wages | | 34,809,612 | 36,563,173 |
| Other Allowance | | 1,439,600 | - |
| Production Incentives | | 6,388,146 | 7,869,889 |
| Overtime | | 3,050,879 | 3,154,843 |
| Defined Contribution Plan (EPF) | | 4,082,582 | 4,390,249 |
| Defined Contribution Plan (ETF) | | 1,107,378 | 1,097,562 |
| Staff Welfare | | 3,802,862 | 4,071,707 |
| Bonus | | 764,475 | 811,575 |
| | | 55,445,534 | 57,958,999 |
| **Support Service Cost** | **11-02** | | |
| Mining Expenses | | 7,922,205 | 9,398,950 |
| Power and Electricity | | 13,726,355 | 13,820,827 |
| Security Charges | | 2,784,788 | 3,576,788 |
| | | 24,433,347 | 26,796,565 |
| **Depreciation** | **11-03** | | |
| Plant & Machinery | | 7,275,095 | 13,853,674 |
| Generator | | 1,400,000 | 1,234,127 |
| Under Ground Development | | 2,855,703 | 1,142,865 |
| | | 11,530,799 | 16,230,666 |

**Analysis of Cost of sales and closing stocks** **11-04**

| | M.T. | Cost of Sales per M.T. | Rs. |
|---|---|---|---|
| O/Stocks | 1,079.29 | 175,850.44 | 189,793,620 |
| Production | 342.35 | 267,006.51 | 91,409,680 |
| | 1,421.64 | 197,802.05 | 281,203,300 |
| Sales | (384.81) | 197,802.05 | (76,115,453) |
| | 1,036.83 | 197,802.05 | 205,087,846 |
| N/Wast | (14.26) | - | - |
| Wast | - | - | - |
| C/Stocks | 1,022.57 | 200,561.18 | 205,087,846 |

| YEAR ENDED 31 MARCH | NOTES | 2021/2022 LKR | 2020/2021 LKR |
|---|---|---|---|
| **12 SUNDRY INCOME** | | | |
| **Agricultural Income** | | | |
| Income from sale of Crops / Coconut wood | | 1,609,395 | 1,264,608 |
| **Less ; Expenses** | | | |
| Labour | | (1,921,759) | (2,353,000) |
| Overtime | | (4,096) | (30,308) |
| 2022 Monthly Allowance | | (70,400) | |
| Defined Contribution Plan (EPF) | | (216,782) | (251,330) |
| Defined Contribution Plan (ETF) | | (54,196) | (62,833) |
| Bonus | | (12,000) | (18,000) |
| Tools & Equipments | | (23,640) | (26,925) |
| Nursery expences | | (284,950) | (2,745) |
| | | (978,428) | (1,480,534) |
| **Other Income** | | 90,000 | 18,000 |
| | | **(888,428)** | **(1,462,534)** |
| **13 PERSONNEL COST** | | | |
| **Directors Remuneration** | | 1,566,605 | 1,740,490 |
| **Staff Salary and Wages** | | | |
| Administration Salary & wages | | 10,480,330 | 11,821,983 |
| Overtime | | 875,368 | 937,005 |
| Allowances - Incentives | | 1,131,189 | 1,005,597 |
| Other Allowance | | 276,500 | - |
| Defined Contribution Plan (EPF) | | 1,257,640 | 1,418,638 |
| Defined Contribution Plan (ETF) | | 314,410 | 354,660 |
| Bonus | | 171,300 | 192,525 |
| | | **14,506,737** | **15,730,408** |
| **Total Personnel Cost** | | **16,073,342** | **17,470,898** |
| **14 ESTABLISHMENT AND ADMINISTRATION COST** | | | |
| Rent | | | |
| Rates & Taxes | | 16,733 | 17,388 |
| Medical Aid | | 385,112 | 68,888 |
| Insurance | **14-1** | 2,137,018 | 1,747,872 |
| Printing & Stationery | | 145,154 | 184,643 |
| Postage | | 77,083 | 61,416 |
| Legal & Professional Fees | **14-2** | 299,220 | 152,810 |
| Security Charge | | 910,388 | 1,192,263 |
| Secretarial Charges | | 198,744 | 224,573 |
| Audit Fees | | 333,000 | 333,000 |
| Travelling & Transport | | 2,881,624 | 1,773,539 |
| License & Permits | | 263,147 | 183,309 |
| Research & Development | | - | 82,000 |
| Training Expenses | | 689,000 | 668,804 |
| | | **8,336,222** | **6,690,505** |

| YEAR ENDED 31 MARCH | | NOTES | 2021/2022 LKR | 2020/2021 LKR |
|---|---|---|---|---|
| | **Insurance** | **14-1** | | |
| | Fire Insurance - Generator | | 54,905.15 | 4,576 |
| | Sharma Surekuma Insurance | | 362,597.58 | 167,326 |
| | Agrahara Insurance Scheeme | | 1,476,000.00 | 1,486,000 |
| | Air Compressor Insurance | | 54,808.06 | 24,363 |
| | Vehicle Insuance | | 188,707.29 | 65,607 |
| | | | 2,137,018.08 | 1,747,872 |
| | | | - | |
| | **Legal & Professional Fees** | **14-2** | | |
| | Labour Tribunal Case | | 111,250 | - |
| | Land Dispute Case | | 155,000 | 152,810 |
| | Professional Charges | | 32,970 | - |
| | | | 299,220 | 152,810 |
| | | | - | - |
| **15** | **MAINTENANCE COST** | | | |
| | Office & Office Equipment Maintenance | | 255,323 | 211,014 |
| | Building Maintenance | | 12,900 | 14,230 |
| | Machinery Maintenance | | 1,816,942 | 1,656,876 |
| | | | **2,085,165** | **1,882,120** |
| **16** | **UTILITY COST** | | | |
| | Water Charges | | 62,104 | 149,064 |
| | Electricity | | 450,001 | 466,293 |
| | Telephone | | 410,843 | 494,299 |
| | | | **922,947** | **1,109,656** |
| **17** | **DEPRECIATION COST** | | | |
| | Building | | 2,248,200 | 2,507,717 |
| | Electrical Equipments | | 7,000 | 3,287 |
| | Motor Vehicle | | 2,690,001 | 2,040,797 |
| | Office Equipments | | 59,162 | 104,610 |
| | Other Assets | | 40,900 | 681,506 |
| | Furniture & Fittings | | 260,000 | 14,898 |
| | | | **5,305,262** | **5,352,815** |
| | | | | - |
| **18** | **SELLING AND DISTRIBUTION COST** | | | |
| | Transport to Wharf - Export | | 549,000 | 612,000 |
| | Sales Promotion | | 197,387 | 40,500 |
| | Sales Discount | | - | - |
| | Advertising Expenses | | 646,925 | 304,875 |
| | Freight Expenses | | 434,632 | 359,877 |
| | | | **1,827,944** | **1,317,252** |
| **19** | **FINANCE COST** | | | |
| | Bank Charges | | 16,877 | 48,671 |
| | Interest Expences | | 958,635 | 1,900,644 |
| | | | **975,512** | **1,949,315** |

| AS AT 31ST MARCH | 2021 LKR | 2022 LKR |
|---|---|---|

## 20 Property Plant and Equipment

| Cost | Balance On 1st April 2021 | Additions | Revaluation Adjustments | Transfer to Consumable Stock | Non Operating Asset | Balance On 31st March 2022 |
|---|---|---|---|---|---|---|
| **Gross Carrying Amounts** | | | | | | |
| Free Hold Land | 25,500,000 | - | 2,550,000 | | | 28,050,000 |
| Building | 83,725,697 | - | (9,205,697) | | | 74,520,000 |
| Plant & Machinery | 138,536,736 | 1,520,370 | (67,301,236) | | | 72,755,870 |
| Electrical Equipment | 1,803,115 | 35,000 | (1,803,115) | | | 35,000 |
| Motor Vehicle | 24,699,000 | - | 2,201,000 | | | 26,900,000 |
| Other Assets | 6,815,061 | 6,000 | (6,412,061) | | | 409,000 |
| Office Equipment | 3,986,102 | 215,810 | (2,856,552) | - | - | 1,345,360 |
| Generator | 15,426,590 | - | 2,073,410 | - | - | 17,500,000 |
| U.G.Development | 11,428,646 | 430,275 | 2,242,154 | - | - | 14,101,075 |
| Furniture & Fitting | 1,956,681 | - | (656,681) | - | - | 1,300,000 |
| **Total Assets** | 313,877,628 | 2,207,455 | (79,168,778) | - | - | 236,916,305 |

Item under column 3 of above schedule included property plant & equipment which later identified as consumable materials has been transferred to the consumable stock

| Depreciation | Rate | Balance on 1st April 2021 | Depreciation | Revaluation Adjustments | Transfer to Consumable Stock | Non Operating Asset | Balance On 31st March 2022 |
|---|---|---|---|---|---|---|---|
| Building | 3% | 19,213,564 | 2,248,200 | (19,213,564) | | | 2,248,200 |
| Plant & Machinery | 10% | 103,433,288 | 7,275,095 | (103,433,288) | | | 7,275,095 |
| Electrical Equipment | 20% | 1,799,828 | 7,000 | (1,799,828) | | | 7,000 |
| Motor Vehicle | 10% | 16,280,097 | 2,690,001 | (16,280,097) | | | 2,690,001 |
| Other Assets | 10% | 4,652,738 | 40,900 | (4,652,738) | | | 40,900 |
| Office Equipment | 20% | 3,817,349 | 59,162 | (3,817,349) | | | 59,162 |
| Generator | 8% | 9,873,018 | 1,400,000 | (9,873,018) | - | - | 1,400,000 |
| U.G.Development | 10% | 7,386,509 | 2,855,703 | (7,386,509) | - | - | 2,855,703 |
| Furniture & Fitting | 20% | 1,926,885 | 260,000 | (1,926,885) | - | - | 260,000 |
| **Total Depreciation** | | 168,383,276 | 16,836,061 | (168,383,276) | - | - | 16,836,061 |
| | | | | | | | |
| **Total Written Down Value** | | 145,494,352 | 16,836,061 | | - | - | 220,080,244 |

KAHATAGAHA GRAPHITE LANKA LIMITED

NOTES TO THE ACCOUNTS

| AS AT 31 MARCH | | NOTES | 2021/2022 LKR | 2020/2021 LKR |
|---|---|---|---|---|
| **21** | **NON OPERATING ASSETS** | | | |
| | Cost as at 1st April | | 23,210,000 | 3,541,760 |
| | Revaluation Adjustments | | - | 231,302 |
| | Balance as at 31st March | | 23,210,000 | 3,773,062 |
| **22** | **STOCK** | | | |
| | Stock Consumables | | 12,930,490 | 12,954,596 |
| | Stock-Graphite | | 205,087,846 | 189,793,620 |
| | | | **218,018,336** | **202,748,216** |
| **23** | **DEBTORS,DEPOSITS & RECEIVABLES** | | | |
| | Accounts Receivable | **23-01** | 27,635,692 | 7,094,703 |
| | Purchase Advance | **23-02** | 10,000 | 121,635 |
| | Deposits | **23-03** | 49,574 | 49,574 |
| | Insurance pre paid | | 368,815 | 385,839 |
| | Sri Lanka Telecom Deposit | | 5,000 | 5,000 |
| | Value Added Tax Receivables | | 6,207,281 | 6,266,612 |
| | Ceylon Electricity Board | | | |
| | Jayawimana Court Case Apeal Dep | | 30,000 | 30,000 |
| | Employee Debtors - Rathnayaka R M A | | 44,465 | 13,609 |
| | DHL Keells (Pvt) Ltd | | 30,000 | |
| | Festival Advance | | - | 20,250 |
| | | | **34,380,827** | **13,987,222** |
| | **Accounts Receivable** | **23-01** | | |
| | Akshtha De Silva | | 96,030 | - |
| | Atire (Pvt) Ltd | | 4,500 | |
| | Eastern Trading | | - | 190,073 |
| | First Graphite Ltd | | 11,584,599.00 | 7,848,895 |
| | Millenium Concreet Technologies (Pvt) Ltd | | (5,400) | |
| | S Kato & Co., | | 15,958,600 | (944,265) |
| | Thilakarathne K G C R | | (3,477) | - |
| | | | 27,635,692 | 7,094,703 |
| | | | (840) | |
| | **Purchase Advance** | **23-02** | | |
| | Jayathilake K P E B | | | 12,691 |
| | Nawarathne N M D C B | | | 6,400 |
| | Dep of Valuation - Kurunegala | | 10,000.00 | 10,000 |
| | premathilake A A S | | | 40,000 |
| | Sierra Cables PLC | | | 17,500 |
| | Asurumuni A A S S | | | 6,440 |
| | Wimalaweera R G L H | | | 18,600 |
| | Herath H M S R | | 10,004.00 | 10,004 |
| | | | **10,000.00** | **121,635** |
| | | | 10,004.00 | |
| | **Deposits** | **23-03** | | |
| | Geologicle Survey & Mines Bureau | | 49,574 | 49,574 |
| | | | 49,574 | 49,574 |

| AS AT 31 MARCH | | NOTES | 2021/2022 LKR | 2020/2021 LKR |
|---|---|---|---|---|
| **24** | **CASH & CASH EQUIVALENT** | | | |
| | Bank Of Ceylon - Redigama | | 36,243 | 625,620 |
| | Bank Of Ceylon -Kollupitiya | | 333,396 | 960,937 |
| | DFC $ A/C - BOC Kollupitiya | | 60,621 | 14,146,930 |
| | Petty Cash - Head Office | | - | 4,869 |
| | Petty Cash - Mine Office | | - | 15,964 |
| | | | **430,260** | **15,754,319** |
| **25** | **STATED CAPITAL** | | | |
| | Called Up Share Capital | | 13,000,000 | 13,000,000 |
| | | | **13,000,000** | **13,000,000** |
| **26** | **DEFERRED TAX LIABILITY** | | | |
| | Balance B/F | | (4,545) | (380,689) |
| | Provision For The Year | | (74,200) | 376,143 |
| | Closing Balance | | **(78,745)** | **(4,545)** |
| **27** | **GRATUITY PROVISION** | | | |
| | Balance B/F | | 16,881,328 | 21,771,407 |
| | Provision For The Year | | 2,593,101 | (1,162,416) |
| | Paid During The Year | | (1,382,756) | (3,727,663) |
| | Closing Balance | | **18,091,672** | **16,881,328** |
| | | | - | - |

| AS AT 31 MARCH | NOTES | 2021/2022 LKR | 2020/2021 LKR |
|---|---|---|---|

## 28 NSB LOAN PAYABLE

| | | | |
|---|---|---|---|
| Rental Amount | 266,013.75 | | |
| Rental Period | 36 | | |
| Cost | 7,895,000.00 | | |
| Interest | 1,681,495.04 | | |
| Total | 9,576,495.04 | | |
| Opening Balance | | 3,542,593.67 | 6,384,330.04 |
| Paid During the year | | (3,413,567.06) | (2,660,137.50) |
| Balance | | **129,026.61** | **3,724,192.54** |
| Long Term | | - | - |
| Current | | 129,026.61 | 3,724,193 |
| Balance | | **129,026.61** | **3,724,193** |
| Interest in Suspense | | | |
| Opening Interest | | 181,598.87 | 728,351 |
| Revenue Account | | (181,598.87) | (546,752) |
| Balance | | **-** | **181,599** |
| Balance | | | |
| Long Term | | - | - |
| Current | | - | 181,599 |
| Total | | **-** | **181,599** |
| Balance | | | |
| Long Term | | - | - |
| Current | | 129,027 | 3,542,594 |
| Total | | **129,027** | **3,542,594** |

| AS AT 31 MARCH | NOTES | 2021/2022 LKR | 2020/2021 LKR |
|---|---|---|---|
| **29 TRADE AND OTHER CREDITORS** | | | |
| 4M International (Pvt) Ltd | | 45,000 | 180,000 |
| A.M.Distributors | | 14,950 | |
| Accounting Secretarial Services(pvt)Ltd | | 57,000 | |
| Accsoft Solutions Pvt Ltd | | | 14,909 |
| Airline Traders | | 45,000 | |
| Alliance Valves & Fitting Company | | 113,800 | |
| B I Commodities & Logistics (Pvt) ltd | | (150) | 155,450 |
| Blackwatch Security Syndicates (pvt) Ltd | | 375,850 | |
| BCC Lanka Limited | | | 107,245 |
| Brown & Company PLC | | 1,275,025 | 119,094 |
| Browns Thermal Engineering (pvt) Ltd | | 135,000 | |
| Cambridge Traders | | 276,000 | 367,250 |
| Car Lovers (pvt) Ltd. | | 24,800 | |
| D N Dinesh Suranga | | 29,710 | |
| DHL Keels(Pvt) Ltd. | | 84,678 | 139,024 |
| Diligant Cargo Services | | 106,818 | 56,358 |
| Dinapala Super Centre | | | |
| Disanayaka Hardware | | 447,548 | 393,740 |
| Eastern Trading Company | | 399,275 | 817,650 |
| ET Lab Manufacturing (Pvt) Ltd | | 25,000 | 12,500 |
| Geological Survy & Mines B. | | | 541,616 |
| Global Enterprises | | 28,160 | 12,500 |
| Gunarhathne D R | | 15,600 | 15,600 |
| Hunter & Company PLC | | 25,033 | |
| Ikon Tech Systems | | | 10,550 |
| Industrial Safty Equipments Co.Ltd | | | 35,000 |
| Infortec Computer System | | | 3,300 |
| Internal Timber Productions | | 72,415 | |
| Janatha Estate Development Board | | 147,000 | |
| Jayalanka Ajencies | | 152,843 | |
| Kulasooriya E H | | 47,000 | |
| Lanka I B C Company (Pvt) Ltd | | (5) | |
| M P C S - Ridigama | | 538,581 | 258,555 |
| M P C S Hiriyala | | 6,400 | 6,600 |
| Manju Electricals | | 57,330 | 9,952 |
| Metropolitan Office (Pvt) Ltd | | | 16,200 |
| Nanayakkara L D J M P | | 203,375 | 118,525 |
| National Insurance Trust Fund | | 427,218 | 121,000 |
| National Water Supply & Dra.Board 1/4 | | 17,238 | 59,146 |
| New National hardware | | 26,240 | 42,460 |
| Nipon Air | | 11,000 | 11,000 |
| NIroshan W E | | 3,000 | 3,000 |
| P M Samarasekara | | 41,350 | |
| Rathna Lee Mola | | 12,000 | |
| Rathkarawwa Servo Lube Distributors | | | 78,758 |
| Rotax 9Pvt) Ltd | | 16,988 | |
| Salim Textiles | | 2,140 | 16,200 |
| Samota Trade Center | | 168,950 | 117,520 |
| Sathosa Motors PLC | | 25,428 | |
| Sewmini Lee Mola | | 50,715 | 109,450 |
| Somapala Motors | | 255 | |
| Sri Lanka Insurance | | 127,802 | |
| Sri Lanka State Trading (General) Cop | | 67,342 | 47,097 |
| Sri Lanka Telecom | | 100,000 | 752,816 |
| St.Anthony's Hardware (Pvt) Ltd | | 825 | 47,495 |
| State Pharmaceuticals Corporation Of Sri | | 16 | |
| Supreme Furbishers | | 29,245 | |

| | | |
|---|---|---|
| The Associated Newspapers of Ceylon Ltd | 238,050 | 304,875 |
| United Motors Lanka PLC | 102,375 | 102,375 |
| United Tractor & Equipment (pvt) Ltd | 237,751 | |
| Vanoja Motor Stores | 104,000 | 12,750 |
| | 6,558,964 | 5,217,558 |

**30 PROVISION FOR TAXATION**

| | | |
|---|---|---|
| Opening Balance | 9,365,368 | 7,064,698 |
| Income Tax Paid | - | - |
| Income Tax Payable for the Year | 2,697,714 | 2,300,670 |
| With Holding Tax - Paid at source On Interest Income | - | - |
| | **12,063,082** | **9,365,368** |
| | - | - |

**31 ACCRUED EXPENCES**

| | | |
|---|---|---|
| Audit Fees -Earnest & Young | - | 241,500 |
| Audit Fees - Auditor General | 1,337,434 | 1,040,659 |
| Defined Contribution Plan (EPF) Payable | 2,476,187 | 766,171 |
| Defined Contribution Plan (ETF) Payable | 337,662 | 24,112 |
| Electricity Board | 6,374,866 | 12,498,327 |
| P.A.Y.E Tax Payable | 1,859 | (3,751) |
| With Holding Tax - Vendor Collections | 6,059 | 6,059 |
| Salaries & Wages Payable Account | 6,346,205 | 4,038,971 |
| Telephone Bills Payable | 39,488 | 16,696 |
| Alpex network security Ltd | 4,516,135 | 5,133,992 |
| Refundable Tender Deposits | (5,000) | 3,562 |
| Nation Building Tax Payable | 185,294 | 185,294 |
| | **21,616,189** | **23,951,591** |

**KAHATAGAHA GRAPHITE LANKA LIMITED**

**INCOME TAX COMPUTATION**

**YEAR OF ASSESSMENT 2021/22**

| | | | | |
|---|---|---|---|---|
| **Profit/(loss) per Account** | | | | 11,085,759.67 |
| less: Interest Income | | | | (2,785,428.40) |
| | | | | 8,300,331.27 |
| **Add Back:** | | | | |
| Gratuity Provision | 2,593,100.82 | 100% | 2,593,100.82 | |
| Legal Fees (LT case) | 155,000.00 | 100% | 155,000.00 | |
| Impairment | - | 100% | - | |
| Depreciation | 16,836,061.20 | 100% | 16,836,061.20 | |
| Advertisement | 646,925.00 | 25% | 161,731.25 | |
| Professional Charges | 144,220.00 | 100% | 144,220.00 | |
| | | | | 19,890,113.27 |
| | | | | **28,190,444.54** |
| **Less:** | | | | |
| Capital Allowances | | | | (12,313,326.08) |
| Gratuity Paid of The Year | | | | (1,382,756.30) |
| Gain on Foreign Exchange Gain/Loss | | | | |
| | | | | 14,494,362.17 |
| Business Profit/(Loss) for the Year | | | | 14,494,362.17 |
| Interest Income | | | | 2,785,428.40 |
| **Total Statutory Income** | | | | **17,279,790.57** |

**Total Taxable Income**

| | | **Income** | Rate | |
|---|---|---|---|---|
| | Export Income | 14,494,362.17 | 14% | 2,029,210.70 |
| | Interest Income | 2,785,428.40 | 24% | 668,502.82 |
| **Total Tax payable** | | 17,279,790.57 | | **2,697,713.52** |

**DEFERRED TAX LIABILITY**

| | | | |
|---|---|---|---|
| Gratuity | Asset | | 18,091,672.32 |
| Capital allowance to be claim (Note 1) | | 27,525,546.52 | |
| Accounting depreciation to be claim | | 43,392,984.46 | |
| Tax over claimed | | 15,867,437.95 | |
| Capital expenses over deduct for taxable profit than accounting profit | Liability | | (15,867,437.95) |
| Coconut Plantation Development | Liability | | (1,694,235.36) |
| Deferred Tax Liability | | | **529,999.01** |
| Tax Rate | 14% | | **74,199.86** |

| | |
|---|---|
| Current Asset / (Liability) as at 31/03/2022 | 74,199.86 |
| Opening Asset / ( Liability) 31/03/2021 | (376,143.49) |
| Over provision | **(450,343.35)** |

**KAHATAGAHA GRAPHITE LANKA LIMITED**

**INCOME TAX COMPUTATION**

**YEAR OF ASSESSMENT 2020/21**

**Dividends Tax Payable**

| | |
|---|---|
| Net Profit After Taxation | 8,462,246.02 |
| Less : Property, Plant & Equipments Acquired | (1,956,645.10) |
| Add : Depreciation for Property, Plant & Equipments Acquired | - |
| Distributable Profit | 6,505,600.92 |

**Note 01 : Capital Allowance on Assets**

| | | TAX WRITTEN DOWN VALUE | | |
|---|---|---|---|---|
| **Assets** | **Claim no** | **Rate** | **Value** | **Claim** |
| **Building** | | | | |
| 2011/12 | 10 | 10% | 1,422,820.50 | - |
| 2012/13 | 10 | 10% | 4,554,425.27 | 455,442.53 |
| 2013/14 | 9 | 10% | 178,545.08 | 17,854.51 |
| 2014/15 | 8 | 10% | 29,575,817.88 | 2,957,581.79 |
| 2015/16 | 6 | 10% | 52,780.20 | 5,278.02 |
| **Electrical Equipments** | | | | |
| 2008/09 | 8 | 12.50% | 10,780.00 | - |
| 2010/11 | 8 | 12.50% | 446,810.00 | - |
| 2014/15 | 3 | 33.33% | 61,200.00 | - |
| 2017/18 | 3 | 33.33% | 35,000.00 | 11,666.66 |
| 2021/22 | 1 | 20.00% | 35,000.00 | 7,000.00 |
| **Other Assets** | | | | |
| 2012/13 | 5 | 20% | 357,100.00 | - |
| 2013/14 | 9 | 6.67% | 3,918,615.00 | 261,238.39 |
| 2014/15 | 8 | 6.67% | 1,970,772.78 | 131,383.54 |
| 2016/17 | 6 | 6.67% | 110,000.00 | 7,337.00 |
| 2016/17 | 6 | 6.67% | 621,989.00 | 41,486.67 |
| 2018/19 | 4 | 20.00% | 925,831.09 | 185,166.22 |
| 2020/21 | 2 | 15.00% | 813,190.50 | 162,638.10 |
| 2021/22 | 1 | 20.00% | 6,000.00 | 1,200.00 |
| **Office Equipments** | | | | |
| 2009/10 | 8 | 12.50% | 181,927.67 | |
| 2010/11 | 8 | 12.50% | 739,029.48 | |
| 2012/13 | 5 | 20% | 560,021.55 | |
| 2013/14 | 5 | 20% | 187,396.25 | |
| 2013/14 | 4 | 25% | 148,000.00 | |
| 2014/15 | 3 | 33.33% | 59,999.00 | |
| 2014/15 | 4 | 25% | 206,000.00 | |
| 2014/15 | 4 | 25% | 4,500.00 | |
| 2014/15 | 5 | 20% | 11,700.00 | - |
| 2014/15 | 3 | 33.33% | 169,285.72 | |
| 2015/16 | 3 | 33.33% | 118,250.00 | - |
| 2016/17 | 4 | 25.00% | 91,000.00 | 22,750.00 |
| 2017/18 | 3 | 33.33% | 24,800.00 | |
| 2017/18 | 3 | 33.33% | 44,450.00 | |
| 2018/19 | 4 | 20.00% | 223,500.00 | 44,700.00 |
| 2019/20 | 3 | 20.00% | 134,300.00 | 26,860.00 |
| 2021/22 | 1 | 20.00% | 215,810.00 | 43,162.00 |
| **Generator** | | | | |
| 2009/10 | 8 | 12.50% | 794,707.00 | |

| | | | | |
|---|---|---|---|---|
| **Plant & Machinery** | | | | |
| 2010/11 | 8 | 12.50% | 3,476,500.00 | - |
| 2015/16 | 2 | 50.00% | 494,750.00 | - |
| 2016/17 | 2 | 50.00% | 3,707,868.80 | - |
| 2016/17 | 2 | 50.00% | 142,541.78 | - |
| 2017/18 | 2 | 50.00% | 291,239.14 | - |
| 2018/19 | 3 | 20.00% | 187,560.00 | 37,512.00 |
| 2019/20 | 2 | 20.00% | 8,204,100.00 | 1,640,820.00 |
| 2020/21 | 1 | 15.00% | 371,756.66 | 55,763.50 |
| 2021/22 | 1 | 20.00% | 1,520,370.00 | 304,074.00 |
| **Motor Vehicle** | | | | |
| 2013/14 | 5 | 20.00% | 1,649,000.00 | - |
| 2018/19 | 3 | 20.00% | 6,100,000.00 | 1,220,000.00 |
| **U.G.Development** | | | | |
| Trally Rails - Underground TruckLines | 1 | 40.00% | 11,428,645.93 | 4,571,458.37 |
| 2021/22 | 1 | 20.00% | 430,275.00 | 86,055.00 |
| **Furniture & Fittings** | | | | |
| 2014/15 | 5 | 20.00% | 468,391.73 | |
| 2018/19 | 3 | 20.00% | 74,488.98 | 14,897.80 |
| | | | **87,558,841.99** | **12,313,326.08** |